| **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013** | | |
|---|---|---|
| **සිංහල** | **3 වසර** | **කාලය පැය 3 යි** |
| * පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න හයකට පිළිතුරු සපයන්න. | | |

(01) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200කට නොඅඩු රචනයක් ලියන්න.

I. පරිසරය සුරකිමු.
II. ද්‍රුමින්ද්‍රාගමනය
III. පිරිවෙන් අධ්‍යාපනය.
IV. වැසි දිනක්.
V. අනගාරික ධර්මපාල තුමා (ලකුණු 25යි)

(02) I. ශිථිලාක්ෂර ලියා දක්වන්න.
II. කණ්ඨජ හා දන්තජාක්ෂර ලියා දක්වන්න.
III. සඤ්ඤකාක්ෂර ලියා දක්වන්න. (ලකුණු 15යි.)

(03) I. උකුසු ශබ්දය සියලු විභක්තිවල වරනගන්න.
II. පහත සඳහන් විසන්ධි පද සන්ධි කරන්න.
වට+උර , කම්+හල , පොල්+අත්ත , චූල+උදර , මුනි+උතුමා
III. "ගය" ධාතුව වර්තමාන කාලයෙහි වරනගන්න. (ලකුණු 15යි.)

(04) I. ජාති, ද්‍රව්‍ය , ගුණ යන නාමවලට උදාහරණ දෙක බැගින් දෙන්න.
II. දකාරාර්ථ සමාසය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
III. පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

i. මිනිසා ගවයන් බඳියි.
ii. ගවයෝ ගැල අදිති.
iii. අපි බුදුන් වඳිමු.
iv. පියා තොප අස්වැසුවේ ය.
v. මව දැරිය නලවයි. (ලකුණු 15යි.)

(05) පහත සඳහන් වාක්‍ය වල ඉරි ඇඳි පදවල විභක්ති නම්කරන්න.
I. i. <u>ගසින්</u> ගෙඩි වැටේ. ii. <u>යදියන්ට</u> දන් දෙමු.
iii. මී මැස්සෝ <u>මල්වල</u> පැණිබොති. iv. ගුරුතුමා <u>මා</u> කැඳවයි.
v. මම <u>පෑනෙන්</u> ලියමි.

II. පහත දැක්වෙන වචනවල ස්ත්‍රීලිංග පද ලියන්න.
සෙබළා , ඇතා , කුරුල්ලා , වඳුරා , මල්ලී

III. සිංහල භාෂාවේ සන්ධි විධි පහක් නම් කරන්න. (ලකුණු 15යි.)

(06) විශාලා මහනුවරට ඇතිවූ තුන්බිය බුදුගුණාලංකාර කවියාගේ වර්ණනයට භාජනය වූ අයුරු විස්තර කරන්න. (ලකුණු 15යි.)

(07) උම්මග්ග ජාතකයෙන් බෝසතුන්ගේ කුමන ගුණාංග ප්‍රකට වේ ද? නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 15යි.)

(08) සත්ව චරිත තුළින් මිනිස් සමාජයට උපදෙස් දෙන කෘතියකි "වනකතා" පැහැදිලි කරන්න. (ලකුණු 15යි.)

The National e-learning Portal for The General Education